

# 9. පිරිසිදුකම සුවය ගෙන දේ

මුස්ලිම්වරුන් වන අපි ඉස්ලාම් පවසන පරිදි සෑම දෙයක් ම පිරිසිදු ව තබා ගනිමු. මල පහ කරන විට ද පිරිසිදුකම රැක ගනිමු. මල පහ කිරීමට වැසිකිළිය භාවිත කරමු. එවිට පාවහන් පැළඳ ගනිමු. වම් කකුල පෙරට තබා වැසිකිළියට ඇතුළු වෙමු. ආවරණ සහිත ස්ථානයක මල පහ කරමු. ඇන තියා මල පහ කරමු. මල පහ කළාට පසු ජලයෙන් සෝදා පිරිසිදු කරගනිමු. සෝදා ගැනීමට වම් අත පාවිච්චි කරමු. ඉන් පසු ව දෑත සබන් ගා සෝදා ගනිමු. වැසිකිළිය ජලයෙන් සෝදා පිරිසිදු ව තබා ගනිමු.





සිටගෙන මුත්‍රා නො කළ යුතුයි. මහ දෙපස, බස් නැවතුම් පොළ, පිට්ටනි, ජලාශ වැනි ස්ථානවල මල පහ කිරීම හා මුත්‍රා කිරීම නො කළ යුතුයි. වැසිකිළිය තුළ කෙළ නො ගැසිය යුතුයි. කතා නො කළ යුතුයි. වැසිකිළිය තුළට ගල් යනාදිය නො දැමිය යුතුයි.

## පැවරුම්

**පහත දී ඇති වචනවලින් සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.**
එම් කකුල, පාවහන්, ස්ථානවල, වැසිකිළිය, එම් අත, ජලාශ, පිට්ටනි

1. මල පහ කිරීමට .............................. සුදුසු ම ස්ථානය වේ.
2. ..................... පෙරට තබා වැසිකිළියට ඇතුළු විය යුතු ය.
3. මල පහ පිරිසිදු කිරීමට ...................... භාවිත කළ යුතු ය.
4. මල පහ කිරීමට යන විට ...................... පැළඳිය යුතු ය.
5. පොදු ............................ මල පහ නො කළ යුතු ය.
6. ..................................... වැනි ස්ථානවල මල පහ නො කළ යුතු ය.